# ආටානාටිය සූත්‍රය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්. ඩබ්. නිපුන තත්සර[1], ඒ. පී. සඳරුවන්[2]

### හැඳින්වීම

ථෙරවාද බෞද්ධ සූත්‍ර දේශනාවන්හි අන්තර්ගතය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී අපට දැක ගත හැකි ප්‍රධාන කරුණක් වන්නේ එම පිරිත් සූත්‍ර භාවිතය පිළිබඳ ව පවත්නා අනවබෝධය යි. පිරිත් සජ්ඣායනා කිරීමේ දී එයට පදනම් වු හේතුව නිවැරදි ව අවබෝධ කර ගත යුතු ය. ශබ්ද හා වචන භාවිතය පමණක් නිවැරදි භාවිතයට යොමු වීම අනර්ථ ය. පිරිත් සූත්‍ර භාවිතයේ දී චිත්ත සන්තානය තුළ එම පිරිත් භාවිත කරන්නේ කුමක් කරුණක් උදෙසා ද යන වග පැහැදිලි ව තිබිය යුතු ය. එසේ වුවහොත් පමණක් නිවැරදි ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එදා මෙන් ම අදත් පිරිත් දේශනා අවස්ථාවල දී අටානාටිය සූත්‍රය දේශනා කරන අවස්ථා කාගේත් විශේෂ අවධානයට ලක් වේ. ඒ මෙම සූත්‍ර දේශනාව භාවිතා කරණුයේ යක්ෂයින් එළවීම සඳහා බැව් ඔවුන්ගේ සිත තුළ දක්නට ලැබෙන හෙයිනි. මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරනු ලබනුයේ ආටානාටිය සූත්‍රය භාවිතය පිළිබඳ ව නිවැරදි ආකල්පය විමර්ශනයට ලක් කිරීම යි.

### අරමුණ

පිරිත් සූත්‍ර භාවිතයේ දී ඇති අනවබෝධය හේතු කොට ගෙන ඒ තුළින් ජනිත වන සාවද්‍ය අවබෝධය දුරු කිරීම මෙහි අරමුණ වේ. අටානාටිය සූත්‍රය වූ කලී ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් දීඝනිකායේ පාථික වර්ගයට අයත් පිරිත් සූත්‍ර දේශනාවකි. බොහෝ දෙනෙකුගේ මතයට අනුව මෙම සූත්‍රය යකුන් පලවා හැරීමට යෙදුණු සූත්‍රයක් බව පිළිගෙන ඇත. වත්මන් සමාජය තුළ මුල් බැසගෙන ඇති ප්‍රධාන ආකල්පය ලෙස ද මෙය හැඳින්විය හැකි ය. නමුත් මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම ආටානාටිය සූත්‍ර දේශනාව භාවිතයේ දී පවත්නා වූ සාවද්‍ය මතය නිවැරදි කිරීම යි.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාල භාවිතය යනාදී ප්‍රාථමික හා ද්විතීයික දත්ත පරිශීලනය යන පර්යේෂණ ක්‍රමවේදය තුළින් විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කෙරේ.

### සාහිත්‍ය විමර්ශනය

බෞද්ධ පිරිත් සූත්‍ර භාවිතය සම්බන්ධ බොහෝ පොත් පත් දක්නට ලැබුණත් එහි මෙම ආටානාටිය සූත්‍රය දේශනාව පිළිබඳ ව නිවැරදි ආකල්පයක් අන්තර්ගත නො වේ. යක්ෂයින් ගෙන්වීම හා පලවා හැරීම යන

[1]. සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. *nipunwithanage4470@gmail.com*
[2]. සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. *prasadhsandaruwan@gmail.com*

කරුණු දෙක සඳහා මෙම සූත්‍ර භාවිත කරන බව බොහෝ ග්‍රන්ථ සහ බොහෝ දෙනෙකුගේ මතය යි. නමුත් මේ පිළිබඳ ව නිසියාකාර විමර්ශනයක් සිදු කිරීම අවශ්‍ය ය.

**පර්යේෂණ සීමාව**

ථෙරවාද බෞද්ධ පිරිත් සූත්‍ර පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී බොහොමයක් සූත්‍ර අන්තර්ගත වන බව සූත්‍ර පිටකය විමසීමේ දී අපට අවබෝධ කර ගත හැකි ය. එහෙත් මෙම විස්තාරික සාරසඞ්ක්ෂේපයෙහි පර්යේෂණ සීමාව ලෙස යොදාගෙන ඇත්තේ සූත්‍ර පිටකයේ දීඝනිකායට අයත් පාථික වර්ගයේ එන ආටානාටිය සූත්‍රය යි.

**සාකච්ඡාව**

මෙම ආටානාටිය සූත්‍ර දේශනාවේ දී ප්‍රධාන වශයෙන් ම කතා කරණු ලබන්නේ අමනුෂ්‍යයන් පිළිබඳ ව ය. බුදුන් වහන්සේ මෙම ආටානාටිය සූත්‍රය දේශනා කරනු ලබන්නේ යක්ෂයින් පලවා හැරීමට නො වන බව මෙම සාකච්ඡාවේ දී අපට අවධාරණය කර ගත හැකි ය. මෙය දේශනා කර ඇත්තේ අමනුෂ්‍ය ආත්ම පිළිබඳ ව සහ එමගින් ඇතිවන අයහපත් ප්‍රතිඵල දැක්වීමට ය. මෙහි දී පවතිනා වැරදි අවබෝධය වන්නේ මෙම සූත්‍රය කොටස් දෙකකින් යුක්ත වන අතර, එහි පළමු කොටසින් සිදු කරනුයේ යක්කු ගෙන්වීම යන බව සහ දෙවන කොටස සජ්ඣායනා කිරීමෙන් සිදු කෙරෙනුයේ යක්කු එළවීම බව දක්නට ලැබීම යි. නමුත් නිසියාකාර ව අවධානය යොමු කිරීමේ දී එය මිථ්‍යාවක් වන බව අපට අවබෝධ කරගත හැකි ය. එසේ ම බොහෝ දෙනෙකුගේ මතය වන්නේ මෙහි දී යක්ෂයින් යන්නෙන් හඳුන්වන්නේ සිව් හෙළයේ සිටි යක්ෂ, නාග, දේව, රාක්ෂ යන අයගෙන් යක්ෂ යන කොට්ඨාසය බව යි. නමුත් එය සාවද්‍ය මතයකි. උදාහරණයක් ලෙස සූත්‍රයේ පැහැදිලි ව දක්නට ලැබෙනුයේ "ඉත්ථිවාහනං කත්වා පුරිසවාහනං කත්වා...." යනුවෙනි මෙමඟින් අවධාරණය යොමු කරණුයේ ස්ත්‍රීන් හා පුරුෂයන් වාහනය කොටගෙන ගමන් ගත් අසුරයන් පිළිබඳ ව ය. නිසැක ව ම මෙම සූත්‍ර දේශනාවේ අන්තර්ගත වන්නේ යක්ෂ, ගාන්ධර්ව, කුම්භාණ්ඩ සහ නාග යන මහා පිරිසක් සමග ඔවුන්ට අධිපති සතරවරම් දෙවිවරු බුදුන් වහන්සේ වෙත පැමිණ යම් අමනුෂ්‍ය පිරිසකගෙන් හෝ මේ කියන පිරිසකගෙන් හෝ සිව්වනක් පිරිසට යම් කරුණක් හිරිහැරයක් වෙනවා නම් එයින් අරක්ෂා කිරීමට තමන් ඇතුළු පිරිස බැඳී සිටින බවත් එසේ උදව්වක් අවශ්‍ය නම් ඔවුන්ට හඬගා කියන ලෙසත් පැවසූ ඉල්ලීම පිළිබඳ ව යි. එහි දී ප්‍රධාන ලෙස ම මෙහි දක්නට ලැබෙන්නේ යක්ෂ අධිපති කුවේර හෙවත් වෙසමුණි පිළිබඳ ව යි. තම සේනාවෙන් බෞද්ධ ජනතාව අරක්ෂා කිරීමට ඇප කැප වී සිටින බව ඔහු බුදුන් වහන්සේට පවසයි. මෙහි දී අපගේ ප්‍රධාන ම මතය වන්නේ මෙය උපයෝගී කර ගන්නේ යක්කු එළවීමට නො වන බව ප්‍රකාශ කිරීම යි. ඒ අනුව මෙම සූත්‍ර දේශනාව ඇසීමෙන් බුදුන් වහන්සේගේ අණට කීකරු වන යක්ෂ, භූත, ප්‍රේත, පිසාච, කුම්භාණ්ඩ ආදී ආත්මයන් පිටවී යාම යි. මන්ද ඔවුන් කුවේර අණට සතර වරම් දේව අණට කීකරු වන බැවිනි. මෙම සූත්‍ර දේශනාව මෙලොව මෙන් ම පරලොව ජීවිතය යහපත් කර ගැනීමට අවැසි දේශනාවක් බව අපට අවබෝධ කර ගත හැකි ය. මෙලොව ජීවිතය යහපත් අයුරින් පවත්වා ගැනිමටත් පංචශීලය ආරක්ෂා කිරිම තුළින් පරලොව ජීවිතය සාර්ථක ජීවිතයකට, ආත්මයකට, නැවත යහපත් අත්මයක් ලබා ගැනීමට හේතු වන බව මෙහි දී දක්නට ලැබේ. මරණ විධි දෙකක්

පවතින බව අපට හඳුනාගත හැකි අතර, ඉන් එකක් වන්නේ ක්‍ෂණික මරණය යි. හදිසියේ දී සිදුවන මරණ මෙනයින් හැඳින්වේ. සම්මුති මරණ යනු ක්‍රමික ව වයසට යාම ආදී වශයෙන් සිදුවන මරණය යි. මෙහි දී ප්‍රකාශ කරනු ලැබූ ක්‍ෂණික මරණ අවස්ථාවේ දී සිදුවන්නේ අප දනට පවත්වාගෙන ආ සිත මරණයෙන් පසුව එම සිත ම වෙනත් ස්ථානයක, වෙනත් ආත්මයක උත්පත්තිය ලැබීමට හේතු වීම යි. පංචශීලය රැකගෙන යහපත් සිතින් සිටිය යුතු බව මෙම සූත්‍ර දේශනාවෙන් ප්‍රකාශ කරයි.

**නිගමනය**

මෙහි දී සාකච්ඡා කළ කරුණු අනුව අපට හඳුනාගත හැකි ප්‍රධාන කරුණු වන්නේ මෙම ආටානාටිය සූත්‍ර දේශනාව යක්‍ෂයන් පළවා හැරීමට නො ව යක්‍ෂයින් පිළිබඳ ව දැනුවත් කිරිමටත් යක්‍ෂයින්ගෙන් සිදු විය හැකි තාඩන පීඩන පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා යොදාගෙන ඇති බව යි. අමනුෂ්‍ය කොට්ඨාසවලින් අරක්‍ෂා වීම සඳහා පංචශිලයේ ජීවත්වීම වැදගත්කම මෙහි අන්තර්ගත වේ. එහි දී මෙම සූත්‍ර දේශනාවේ පළමු කොටසින් ප්‍රකාශ කරණු ලබන්නේ යක්කු ගෙන්වීම යන කරුණ නො ව යක්‍ෂයින් සමග සතරවරම් දේවතාවුන් වහන්සේගේ සහ බුදුරජාණන් වහන්සේ අතර පැවති සාකච්ඡාව වන බව හඳුනා ගත හැකි ය. දෙවනු ව සඳහන් වන්නේ යක්කු පළවාහැරීම නො ව එමඟින් සිදුවන්නේ යක්කු එම ස්ථානයෙන් ඉවත් ව යෑම යි. එය ඔවුන් ස්වකීය කැමැත්තෙන් සිදු කරයි.

**පර්යේෂණ යෝජනා**

ථෙරවාද බුදු සමයේ දක්නට ලැබෙන ත්‍රිපිටකයට අයත් දීඝනිකායේ අන්තරගත වන සූත්‍ර දේශනාවක් වන ආටානාටිය සූත්‍ර පිළිබඳ ව නිවැරදි අවබෝධයක් සමාජ ගත කළ යුතු ව ඇත. එහි දී පවත්නා වූ වැරදි අවබෝධය නැති කිරීමට පාලි භාෂාව සූත්‍ර දේශනාවන් පිළිබඳ ව හසල දැනුමක් ඇති මහා ස්ථවිරයාණන් වහන්සේලා, පුද්ගලයන් මේ සඳහා ප්‍රධානත්‍වය ගෙන කටයුතු කළ යුතු ය. ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේලා දැනුවත් කීරිම මඟින් එමඟින් නිවැරදි අවබෝධයක් ජනතාවට ලබාදිය හැකි ය. එමඟින් ථෙරවාද බුදුදහමේ එන ප්‍රධානතම සාධකයක් වන පිරිත් සූත්‍ර දේශනාවන්හි පවතින්නා වූ වැරදි අවබෝධය මඟහැරිමට හැකිවනු ඇත.

**මුඛ්‍ය පදඃ** ආටානාටිය, දීඝනිකාය, යක්‍ෂ, පිරිත්, සාවද්‍ය මත

**මූලාශ්‍රය**


- තිලකරත්න, ආනන්ද එන්. (2009). **අටානාටිය සූත්‍රය.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්තානය.
- විමලජෝති හිමි, කිරම (2012). **සිංහල දීඝනිකාය.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- සොයිසා, ඒ.පී. (පරි). (2012). **ත්‍රිපිටකය සූත්‍ර පිටකය දීඝනිකාය,** 2 කාණ්ඩය. කොළඹ 10ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
- ධම්මපාල හිමි. ඉඤරතන හිමි, හත්තොටුවේ (පරි). (2011). **ලීනත්ථප්පකාසනී නම් වූ දීඝනිකාය ටිකාඃ** පාථික වර්ගයඃ සිංහල පරිවර්තනය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.